ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ශ්‍රී ලංකා ශේෂ්ඨාධිකරණයේ නිලධාරීන් 15ක් සඳහා ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පුහුණු වැඩසටහනක්</u>

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිසක් ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මැයි 9 – 13 දක්වා සංවිධානය කරන ලද සිව් දින පුහුණු වැඩසටහනක් සාර්ථකව අවසන් කළහ.

2. මෙම වැඩසටහන අතරතුරදී, නියෝජිතයන්ට ඊ-අධිකරණ ව්‍යාපෘතිය, පුස්තකාලය, ලිපිගොනු සැකසීම්, ලැයිස්තුගත කිරීම්, පරීක්ෂා කිරීම්, ස්කෑන් කිරීම් සහ වාර්තා තැබීම් ආදි අධිකරණ ක්‍රියාවලීන් ඇතුළු ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයේ තාක්ෂණික සහ ඩිජිටල් පරිවර්තනය පිළිබඳව හඳුන්වාදෙනු ලැබීය. ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ඒ පිළිබඳව විස්තර කළ අතර විනිවිදභාවය, කාර්යක්ෂමතාවය සහ ප්‍රවේශ්‍යතාවය වැඩි දියුණු කරන ලද පද්ධතීන් පිළිබඳව දැනුම ලබා දුන්නේය.

3. මෙම මුලපිරීම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අධිකරණ විශිෂ්ටත්වය සහ තාක්ෂණික නව්‍යකරණය සඳහා ශක්තිමත් ද්විපාර්ශවික සබඳතාවය සහ අන්‍යෝන්‍ය කැපවීමට සාක්ෂ්‍යයක් වේ. ජාත්‍යන්තර අධිකරණ ආයතන සමඟ දැනුම බෙදාහදා ගනිමින් සහ සහයෝගීතාවය වර්ධනය කරගනිමින් ඉන්දියාවේ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ මඟපෙන්වීම යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පුහුණුවීම් භාර අංශය මෙම මුලපිරීමට සහයෝගය ලබා දුන්නේය.

2024 මැයි 15
කොළඹ

මූලාශ්‍රය : https://www.sci.gov.in/supreme-court-of-india-organizes-training-programme-for-registry-officials-of-supreme-court-of-sri-

lanka/#:~:text=of%20Sri%20Lanka-,Supreme%20Court%20of%20India%20organises%20Training%20Programme%20for%20Registry,Supreme%20Court%20of%20Sri%20Lanka&text=A%20delegation%20consisting%20of%2015,the%20Supreme%20Court%20of%20India.